# සංස්කෘතික භූ දර්ශන ඇසුරින් හඳුනා ගත හැකි සම්මත ඉතිහාසයෙන් ඔබ්බට පියමනින දක්ෂිණ අනුරාධපුර වෙස්සගිරියේ ඉතිහාසය.

**ඩී. තුසිත මැන්දිස්**

ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරි

ජේතවන ව්‍යාපෘතිය

## ප්‍රවිශ්ටය

පුරාණ අනුරාධපුර නාගරික සැලැස්මේ දක්ෂිණ ඛණ්ඩයේ පිහිටන්නා වූ භූ කලාපය තුළට දක්ෂිණ ථූපය, රන්මසු උයන ඉසුරුමුණිය හා වෙස්සගිරිය වශයෙන් වර්තමානයේ ව්‍යවහාරවන්නා වූ පුරාවිද්‍යා ස්ථාන අයත් වේ. මෙම පුරාවිද්‍යා ස්ථාන තුළින් වර්තමානය දක්වා ම පර්යේෂණ සිදුවන ස්ථානයක් වශයෙන් වෙස්සගිරිය වැදගත් වේ. අතිශයින්ම සිත්ගන්නා සුළු ස්වාභාවික පාෂාණ උද්ගත තුනකින් සුසැදි මේ භූ කලාපය තුළ මෙතෙක් සිදුකර ඇති පුරාවිද්‍යා පර්යේෂණ තොරතුරු අනුව එහි පුරාණ සංස්කෘතික භූ දර්ශනය හඳුනා ගැනීමට (Ancient Culture Landscape) හැකියාව ලැබී තිබේ.

## සම්මත ඉතිහාසය

මහාවංසයේ සඳහන්වන පුවතකට අනුව මිහිඳු මහරහතන් වහන්සේ ජීවමාන සමයේ දී වෛශ්‍ය කුලයට අයත් පන්සියයක් සංඝයා විසූ විහාරය වෙස්සගිරිය වශයෙන් ව්‍යවහාර වී තිබේ(ම.ව. xx:15–20). වෙස්සගිරිය වශයෙන් මහාවංසය ව්‍යාවහාර කරන මෙම ස්ථානය අනුරාධපුර දක්ෂිණ ඛණ්ඩයේ තිසාවැවට නැගෙනහිරින් පිහිටන්නා වූ ස්ථානය වන බව විවිධ විද්වතුන් අදහස් කරන ලද අතර ඒ අනුව සිදුකරන ලද මුල් යුගයේ පුරාවිද්‍යා පර්යේෂණ වලදී මෙම ස්ථානය වෙස්සගිරිය වශයෙන් නාමකරණය කර තිබේ. ඒ අනුව, මෙහි සිදුකර ඇති පුරා අක්ෂර විද්‍යා පර්යේෂණ අනුව මෙම විහාරය තුළ ක්‍රි.පූ. 2 සියවස තරම් ඈතට විහිදෙන බ්‍රාහ්මී අභිලේඛණ ඇති බව වාර්තා කර තිබේ (Paranavitane 1970). මූලාශ්‍ර සාධක හා අභිලේඛන සාධක අනුව වෙස්සගිරිය වශයෙන් ව්‍යවහාර කරන ආරාම සංකීර්ණ අයත් ස්ථානය ක්‍රි.පූ. 2-3 සියවස තරම් පැරණි බව සම්මත ඉතිහාසය අනුව පැහැදිලි වී ඇත. ඉන්පසු මධ්‍ය ඉතිහාසයේ සංවර්ධනය වූ විහාරාරාමය අනුරාධපුර පශ්චිම භාගය දක්වා ම සංවර්ධනය වූ බව අභිලේඛන හා වාස්තු විද්‍යා නෂ්ඨාවශේෂ මගින් ද පැහැදිලි වේ.

## නාමකරණයේ නිවැරදිතාව හදුනා ගැනීම

ඉහතින් විස්තරකරන ලද වෙස්සගිරිය වශයෙන් වර්තමානයේ දී වහරණු ලබන විහාරයේ නාමකරණය පිළිබද ව විවිධ විද්වතුන් අදහස් ප්‍රකාශ කොට තිබෙන අතර එයින් බොහෝ දෙකකුගේ මතය වන්නේ වත්මනෙහි වහරණු ලබන වෙස්සගිරිය යන නාමය මෙම විහාරය සඳහා පෙරකල භාවිතා නොකර ඇති බව ය. මාහාචාර්ය, සෙනරත් පරණවිතාන සූරීන් දක්වා ඇති අදහස්වලට අනුව මහාවංසයේ සඳහන් වන අකාරයට වෙස්සගිරිය වශයෙන් හඳුන්වා ඇත්තේ *රන්ගිරි දඹුලු විහාරයයි*. ඒ සඳහා ඔහු ගොනුකරන ලද තර්කය අතිශයින් ම වැදගත් වේ. ඔහු පෙන්වාදෙන ආකාරයට දඹුල්ල වෙස්සගිරිය වශයෙන් හැඳින ගැනීම සඳහා කාරනා ගණනාවක් තිබේ. එයින් එකක් වන්නේ ටීකාවේ සඳහන්වන *ජාතපබ්බතයේ* පිහිටීමයි. ඒ අනුව, ජාත පබ්බතය අනුරාධපුරයේ සිට යොදුන් දෙකකට මදක් ඔබ්බෙන් ගිණිකොන දෙසින් පිහිටි බව පෙන්වා දෙයි(පරණවිතාන 1969). යොදුන පිළිබඳ අර්ථකතනය කරන පරණවිතාන මහාවංසයේ සඳහන් වන යෝජනය ඉංග්‍රිසි සැතපුම් අටකට හෝ නවයකට සමාන විය හැකි බව පෙන්වා දෙයි. එසේම කොඩ්රින්ටන් ප්‍රකාශ කරන ආකාරයට *අභිධානප්පදීපිකා* නම් නිඝණ්ටුවේ එන දුර මැනීමේ චක්‍රයෙහි සඳහන් යෝජනයට වඩා බොහෝදුර බව පෙන්වා දෙයි(එම). ඒ අනුව, ටීකාචාර්ය දක්වන යෝජනය සැතපුම් 15-46ත් විය හැකි බව පෙන්වා දෙන පරණවිතාන අනුරාධපුර නගරයට යොදුන් දෙකක් දුරින් වෙස්සගිරිය පිහිටන බව සඳහන් මහාවංස සඳහන අනුව එය වත්මන් දඹුල්ල විය හැකි බව පෙන්වා දෙයි.

ඔහු වැඩිදුරටත් පෙන්වා දෙන ආකාරයට ජාතපබ්බතයෙහි සද්ධාතිස්ස රජු ආරාමයක් කරවූ බව ටීකාචාර්ය ප්‍රකාශ කොට තිබෙන බැවින් ඒ පිළිබඳවද පිළිගත හැකි සාධක දඹුලු විහාරයේ තිබේ. දඹුලු මහ ලෙනේ කටාරමට යටින් කොටා තිබෙන ලිපියේ එම ලෙන පූජාකල තැනැත්තා ගමණිතිස, සද්ධාතිස්ස රජු වියහැකි බව පෙන්වා දෙයි(එම). ඒ අනුව, ඒ රජු විසින් ඉදිකරන ලද ජාතපබ්බතය පසුකල *විශ්වගිරි* නමින් හැඳින් වූ බවත් *විශ්වගිරි* යන්නෙන් වෙස්සගිරි යන පාලි කමේ සංස්කෘත රූපය හඳුනා ගත හැකි බවත් දක්වයි. ඒ අනුව නිවැරදි ලෙස පුරාණ වෙස්සගිරිය දඹුළු විහාරය විය හැකි බව පෙන්වා දෙන ඔහු මහාවංසයේ එන ඉතිහාස කතාව අනුව මිහිඳු හිමියන් අභිමුවේ දී සසුන් ගත වූ වෙස්සන් (වෛශ්‍යයන්) පන්සියයක් විසූ විහාරය වෙස්සගිරිය වශයෙන් හඳුන්වා බෞද්ධාචාර්යයන් විසින් ඕනෑකමින් බැතිමතුන්ගේ සිත්තුල රෝපණය කළ ජනප්‍රිය විශ්වාසය අනුව දැනට වරදවා වහරනු ලබන අනුරාධපුරයේ තිසාවැව ආසන්නයේ පිහිටන කටාරම් ගැටි සහිත විහාරය වෙස්සගිරිය නොවන බව පෙන්වා දෙයි.

එසේ නම් තිසාවැවට නැගෙනහිර පසින් කටාරම් ගැටි සහිත ලෙන් විහාර 26කට වඩා වැඩි ප්‍රමාණයක් පිහිටන ස්ථානය පෙර කල කුමන නමකින් හඳුන්වන්නට ඇත්දැයි විමසීම ද කාලෝචිත වේ. 1906/07 පුරාවිද්‍යා කොමසාරිස් තැනගේ පාලන

වර්තාවෙහි සඳහන් කොට ඇති යථෝක්ත ස්ථානයෙන් (තිසාවැවට නැගෙනහිර පසින් පිහිටන පාෂාණ උද්ගත අයත් ස්ථානය) සොයා ගන්නා ලද සිව්වැනි මහින්ද රජුගේ සමයට අයත් ශිලාලේඛනයක *ඉසුරුමෙණ බෝ උපුල්වන් කසුප්ගිරි විහාරයට* අයත් කුඹුරු ගොවිතැන් කිරීමට තිසාවැවෙන් ජලය ලබා ගැනීම සම්බන්ධයෙන් විහාරයත් රාජකීය නිලධාරිනුත් අතර ඇති වූ ආරවුලක් පිළිබඳ ව සඳහන් වේ. මෙම ආරවුල රජු හමුවේ තැබීම සඳහා එම විහාරයේ භික්ෂූන්ගේ නියෝජිත මණ්ඩලය මහාවිහාර නිකායේ නායක තෙරුන් විසින් මෙහෙයවනු ලැබ තිබේ(A.S.C.A.R 1906-07). එම අභිලේඛන සඳහනට අනුව ඉතා පැහැදිලි ලෙස පෙරකල මෙම ස්ථානය ඉසුරුමෙණ එසෙත් නැතහොත් පසුකලක දී ඉසුරුමුණිය, ඉස්සරසමන ආදි නාමකරණයන්ගෙන් හඳුන්වන්නට ඇතැයි විශ්වාස කල හැක.

මේ පිළිබඳව අදහස් දක්වන මහාචාර්ය, ආර්. ඒ. එල්. එච්. ගුණවර්ධන ප්‍රකාශ කොට ඇත්තේ වෙස්සගිරිය වශයෙන් වරදවා දැනට හඳුන්වන ලබන නටඹුන් විහාරය ඉස්සරමණ (ඉසුරුමෙණ) විහාරය බවයි (ගුණවර්ධන 1969). මේ පිළිබඳ ව අදහස් දක්වන ඩී. එම්. ඩී. ඉසඩ් වික්‍රමසිංහ පෙන්වා දෙන්නේ ඉසුරුමුණිය වශයෙන් වත්මනෙහි ව්‍යවහාරිත විහාරය වෙස්සගිරිය වශයෙන් වත්මනෙහි වහරනු ලබන විහාරය දෙකක් නොව එකක් බවයි (EZ. vo. iv). මෙම තොරතුරු හා පසු කාලීන සම්භාව්‍ය ලේඛන තොරතුරු අනුව ද අනුරාධපුර දක්ෂිණ අන්තයේ පිහිටනු ලබන්නේ වෙස්සගිරිය නොව ඉසුරුමුණිය බව පැහැදිලි වේ. 13වන ශතවර්ෂයේ රචිත සද්ධර්මාලංකාරයේ සඳහන්වන ආකාරයට අනුව අනුරාධපුර ඇතුළුපුරයේ දකුණු දොරටුව දෙසින් දකුණට දිවගිය මාර්ගය ඉසුරුමුණිය දෙසින් මලයරට දක්වා ඇදී ගිය බව දක්වා තිබේ(සද්.ලං. 502). මෙම ගමන්පථය දුටුගැමුණු රජතුමාගේ යෝධයකු වූ වේළුසුමන යෝධයා ද තිසාවැවෙන් ජලය ගෙන ඒමට භාවිතා කොට තිබේ(මව. I භාගය). මෙම කරුණු පෙළ ගැස්ම අනුව පෙන්වා දිය හැක්කේ පුරාණ අනුරාධපුර දක්ෂිණ අන්තයේ පිහිටන්නා වූ මනහර කටාරම් ගැටි සහිත ලෙන් විහාර සංකීර්ණය පෙර කල වෙස්සගිරිය වශයෙන් නොව ඉසුරුමුණිය වශයෙන් හඳුන්වා ඇති බවයි.

## සංස්කෘතික භූ දර්ශනය ඇසුරෙන් හඳුනා ගත හැකි සම්මත ඉතිහාසයට පෙර ඉතිහාසය

ඉසුරුමුණි විහාරය වශයෙන් අභිලේඛනවල පෙර කල හඳුන්වනු ලැබූ ආරාම සංකීර්ණයේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ ආරම්භය යටත් විජිත පාලන සමය දක්වා දිවෙයි. මෙරට ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් තැන වූ එච්. සී. පි. බෙල් විසින් මෙම විහාරයේ වූ වාස්තුවිද්‍යා අංග මතුකර ගැනීම සඳහා කැණීම් සිදුකොට ඇත. ඉන් අනතුරු ව සෙනරත් පරණවිතාන, ඩී. එම්. ඩී. ඉසඩ් වික්‍රමසිංහ, කොත්මලේ අමරවංස, මාලනී ඩයස් යන විද්වතුන් ද මෙහි වූ ශිලාලේඛන පිළිබඳ ව අධ්‍යයනයන් සිදුකොට ඉතිහාසය හඳුනා ගැනීමට ප්‍රයත්න දරා ඇත.

වෙස්සගිරියේ ඉතිහාසය සම්මත සීමාවෙන් ඔබ්බට ගමන් කළ හැකියැයි අනුමාන කරමින් ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ ජේතවන ව්‍යාපෘතියේ පුරාවිද්‍යා අධ්‍යක්ෂක මහාචාර්ය, සුදර්ශන් සෙනවිරත්න විසින් එහි සංස්කෘතික භූ දර්ශනය හඳුනා ගැනීම සඳහා ගවේශණ හා කැණීම් 2006 වසරේ දී ආරම්භ කරන ලදි. ඒ අනුව, මෙතෙක් සිදුකරන ලද සීමිත කැණීම් හා ගවේශණ මගින් මෙම ආරාම සංකීර්ණයේ ඉතිහාසය සම්මත සීමාවෙන් බොහෝ එපිටට පියමනින බව හොයාගෙන ඇත.

වෙස්සගිරියේ භූ කලාපයේ පැරණි සංස්කෘතික භූ දර්ශනයේ මතුපිට පැවති දත්ත හඳුනා ගැනීම උදෙසා පාෂාණ උද්ගතයේ සිට නැගෙනහිර පසට කි.මී. 1ක් පමණ මල්වතුඔය දක්වා ද පාෂාණ උද්ගතයෙන් බටහිරට තිසාවැවේ තාවුල්ල දක්වා කි.මී. 3ක් ද දුර හරස්කඩ සැලැස්මක් ලබා ගන්නා ලදි. ඒ අනුව තිසාවැව ඉස්මත්ත හා පාෂාණ උද්ගතය පිහිටි ප්‍රදේශ අතර පිහිටන්නා වූ භූ කලාපය තුල හඳුනා ගත හැකි බඩවැටි ප්‍රදේශය කෙරේ අවධානය යොමුකොට ක්‍රමික ගවේශණයක් සිදුකරන ලදි. එම ගවේශණයට පේරාදෙණි විශ්වවිද්‍යාලයේ දෙවන වසර(පුරාවිද්‍යා) සිසුන් දායකත්වය දැක් වූ අතර ඒ ඔස්සේ නිශ්චය කරනු ලැබූ ස්ථාන දෙකක් පරීක්ෂණ කැණීම් සඳහා තෝරා ගන්නා ලදි. අදාල කැණීම් ස්ථාන VGHL Ex. 01 හා VGHL Ex. 02 වශයෙන් නාමකරණය කරනු ලැබූ අතර අදාල කැණීම් මගින් සොයාගනු ලැබූ මානවකෘති හා පරිසර දත්ත වෙස්සගිරියේ පුරාණ සංස්කෘතික භූ දර්ශනය හා එහි ඉතිහාසය හඳුනා ගැනීමට පිටිවහල් වුණි.

සිරස් අවකාශයේ ස්ථාන ගත කරුණු ලැබූ අදාල පරීක්ෂණ කැණීම් තුළින් සොයා ගනු ලැබූ දත්ත තිරස් අවකාශයේ සන්දර්භ ගත කිරීම තුළින් පහත සඳහන් වන්නා වූ මූලික සංස්කෘතික ලක්ෂණ සහිත ඉතිහාසය වෙස්සගිරිය (ඉසුරුමුණිය) ඇසුරින් හඳුනා ගැනීමට අවකාශ ලැබී තිබේ.

01. ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික අවධිය (Pre Historic Culture)
02. මූල ඓතිහාසික සංස්කෘතික අවධිය (Proto Historic Culture)
03. මුල් ඓතිහාසික සංස්කෘතික අවධිය (Early Historic Culture)
04. මධ්‍ය ඓතිහාසික සංස්කෘතික අවධිය (Middle Historic Culture)

## ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික තොරතුරු

VGHL Ex. 01 හා VGHL Ex. 02 කැණීම් සාධක වලට අනුව වෙස්සගිරිය බටහිර බඩවැටි ප්‍රදේශයේ මතුපිට සිට මීටර් දෙකක් පමණ මව් පාෂාණය (Bed Rock) දක්වා සිදුකරනු ලැබූ කැණීම් වල දී මව් පාෂාණයට මතුපිටින් රතු දුඹුරු පාංශු කලාපය වාර්තා විය. භූ විද්‍යානුකූල ව රතුවන් දුඹුරු (Reddish Brown Earth (RBE)) වශයෙන් මෙම පස් තැන්පතුව හඳුන්වනු ලැබේ(Cooray 1984). මෙම පාංශු කලාපය අදාල භූමියේ මීටර් 1ක් පමණ ඝනත්වයක් දක්වන අතර එහි මතුපිට සිට සෙ.මී. 40 දක්වා පමණ වනතුරු

තිරුවානා පතුරු හා කහද පතුරුවල බහුල බවක් පෙන්නුම් කරයි. ඒ අනුව අදාල කැණීම් තුළින් තිරුවානා පතුරු 6,000කට වැඩි ප්‍රමාණයක් වාර්තා වූ අතර ඒවා පහත සඳහන් ආකාරයට වර්ග කිරීමට ලක් කරන ලදි.

01. න්‍යෂ්ටී (Core)

02. පතුරු කොටස් (Plack Piece)

03. භාවිතයට ගත නොහැකි ලෙස ඉවත් වූ පතුරු කොටස් (Waste)

මෙම පාෂාණ කොටස් 6,000ක ගොනුවෙන් අති බහුතරයක් වූයේ පතුරු කොටස් (Plack Piece) වන අතර එම පතුරු කොටස් 4,000කින් කහද හා තිරුවානා පාෂාණ වලින් මිනිසුන් නිර්මානය කරන ලද ගල් අවි (Stone Tool) 06ක් පමණ හඳුනා ගත හැකි විය. අදාල ගල් අවි අනුව මෙම ප්‍රදේශය තුළ ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියක් ක්‍රියාත්මක වූ බවට ප්‍රබල අනුමානයක් ලබා ගත හැකි අතර ඒ ඔස්සේ සිදු කරන ලද මූලික භූ කලාප අධ්‍යයනයේ දී ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියක් ක්‍රියාත්මක වීමට මෙම භූමිය ස්වභාවයෙන් වැදගත් වන බව පැහැදිලි වේ.

වෙස්සගිරි භූමියේ මුල් කාලීන භූ දර්ශනය කෙරේ අවධානය යොමු කිරීමේදී ඉතා පැහැදිලි වන්නේ ස්වභාවික ගල්ලෙන් සහිත භූ කලාපයක් මෙහි වූ බවයි. ප්‍රාථමික සංස්කෘතික අවධියක විසූ ප්‍රාග් ඓතිහාසික මිනිසුනට සිය නිවස්නයන් මෙවැනි ස්ථාන ඇසුරෙන් සකසා ගැනීමට මහගු පිටිවහලක් ලැබෙන අතර අදාල භූ කලාපයේ ස්වභාවික පරිසරය ඔවුන්ට අවශ්‍ය සත්ව දඩයම හා එලවැල නෙලා ගැනීමට සැකසී තිබෙන්නට ඇත. විශේෂයෙන් පුරාණ පරිසරය තුළ තිසාවැවට නැගෙනහිරින් පිහිටන හා වෙස්සගිරිය පාෂාණ උද්ගතයට බටහිර පිහිටි පාෂාණ වලින් සෑදුම්ලත් ස්වභාවික බඩවැටිය ස්වභාවයෙන් ජලය රැස් වූ පතස් නිර්මාණය කරන්නට ඇත. ඒ ඔස්සේ අදාල ස්ථාන ඇසුරෙන් මත්ස්‍යය හා සත්ව දඩයම කිරීමට වෙස්සගිරිය නිවස්න කරගත් ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ට පහසු වන්නට ඇත. මෙම පැරණි සංස්කෘතියක් ක්‍රියාත්මක වීමට පසුබිම තවත් වැඩි වන්නේ අනුරාධපුර ඇතුළුපුරයේ ආචාර්ය, සිරාන් දැරණියගල මධශිලා සංස්කෘතියක් පිළිබඳව තොරතුරු වාර්තාකර තිබෙන බැවිනි(Daraniyagala 1992). එසේම, අනුරාධපුර නාගරික ප්‍රදේශයේ මෙන් ම ඉන් පිටතත් ප්‍රාග් ඓතිහාසික මිනිසුන් ජීවත් වූ බවට තොරතුරු ජේතවන භූමියෙන් හා වෙස්සගිරියෙන් ලැබෙන බැවින් අනුරාධපුර භූ කලාපය තුළ ප්‍රාග් ඓතිහාසික මිනිසුන් පොකුරු කුඩා ජනාවාස තුල වාසය කරන්නට ඇතැයි ද මේ දත්ත අනුව හඳුනා ගත හැක.

වෙස්සගිරිය ආංශුක ප්‍රදේශයේ භූ දර්ශනයේ දෙවන සන්දර්භ ගත වීම මූල ඓතිහාසික යුගයේ (Proto History) සිදු වූ බවට උපකල්පනය කල හැකි සාධක හමුවීම අතිශයින් ම වැදගත් වේ. අප ඉහතින් විස්තර කරන ලද ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික තැන්පතුවට මතුපිටින් වාර්තා වන අළු පැහැ පාංශු කලාපය තුළින් මූල ඓතිහාසික සංස්කෘතික සමයට අයත්වන කාලරක්ත වර්ණ මෙවලම් (BRW) හා කෝව කොටස්

වාර්තාවීම කැපී පෙනේ. මෙම මැටි මෙවලම් තුල මුල ඓතිහාසික යුගයේ මැද භාගයේ භාවිත වූ හැඩතල සහිත බඳුන් තිබීම මගින් හා අනුරාධපුරයේ ඇතුළුපුරයේ මෙන් ම RBE තැන්පතුව මතුපිටින් මෙම කාල රක්තවර්ණ මැටි මෙවලම් හමුවන තැන්පතු හමුවීම මගින් මෙම භූ කලාපය ආශ්‍රයෙන් යතෝක්ත අවධිය ක්‍රියාත්මක වන්නට ඇතැයි අනුමාන කල හැක.

මෙම දත්ත සංස්කෘතික භූ දර්ශනය සඳහා සන්දර්භ ගත කිරීමේ දී ප්‍රධාන වශයෙන් මේ කලාපයේ භූ පරිසරය ප්‍රාග් ඓතිහාසික පරිසරයට වඩා වෙනස් ව පවතින්නට ඇති බව අනුමාන කළ හැක. මේ සමය වන විට මිනිසුන් ප්‍රාථමික ග්‍රාමීය සංස්කෘතියක් ක්‍රියාත්මක කරන්නට ඇති අතර ඒ ඔස්සේ මූලික කෘෂිකර්මාන්තය හා එඬේර කටයුතු පවත්වා ගන්නට ඇත. මෙහි දී කෘෂිකාර්මික හා එඬේර කටයුතු වලට මෙන් ම ජන ජීවිතයට අවශ්‍ය ජලය ලබා ගැනීම උදෙසා ද අහස් ජලය ගබඩා කිරීමට මූලික ව පෙළඹෙන්නට ඇත. ඒ අනුව පතස් වශයෙන් ප්‍රාග් ඓෛතිහාසික මිනිසුන් භාවිතා කළ බඩවැටි ප්‍රදේශය ආශ්‍රයෙන් අතින් ඉදි කරන ලද කෙටි වේල්ලක් මගින් ජලය රඳවා ගැනීම සිදු කරන්නට ඇතැයි අනුමාන කළ හැක. ප්‍රොටෝ ඓතිහාසික ජන පිරිස් ඉහත ආකාරයට අහස් ජලය ගබඩා කරන ලද ස්ථාන වශයෙන් ඉබ්බන්කටුව ඉදමොරළුව වැව හා යාන්ඔය නිම්ණයේ ඉදිකරන ලද මූලික වැව් හඳුනා ගත හැකි බව මහාචාර්ය, සුදර්ශන් සෙනවිරත්න පුරා පරිසරවිද්‍යා අධ්‍යයන මඟින් පෙන්වා දී ඇත (සෙනවිරත්න 1996). එමෙන් ම ක්‍රි.පූ. 950දී පමණ අනුරාධපුර ඇතුළුපුර ජනාවාසයේ ක්‍රියාත්මක වූ ප්‍රොටෝ ඓෛතිහාසික ජන පිරිස් ජන රේඛනයේ ප්‍රසාරණය සමඟ එම භූමියෙන් විතැන් වෙමින් මෙවැනි එයට ආසන්න ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගන්නට ඇත. එවැනි එක් අවස්ථාවක් වෙස්සගිරියේ මෙම පැරණි භූමි දර්ශනය ඇසුරින් හඳුනා ගැනීමට හැකි වී තිබේ.

වෙස්සගිරිය භූ කලාපයේ ඉතිහාසය අධ්‍යයනය කිරිමේ දි සංස්කෘතික භූ දර්ශනයේ මීළඟ අවස්ථාව ලෙස මුල් ඓෛතිහාසික සමය (Early History) හඳුනා ගත හැක. ක්‍රි.පූ. 300න් පසු ඇරඹෙන මේ සමය තුළ දී මෙම ප්‍රදේශයේ ලෙන් විහාර පද්ධතියක් ඇරඹෙන බව පෙනේ. විශේෂයෙන් මේ කාලය වන විට බෞද්ධාගමේ පුනර්ජීවය මඟින් භික්ෂූන් සඳහා ස්වාභාවික ලෙන් කටාරම් කොටා පූජාකර තිබීම කැපි පෙනේ. ඒ අනුව ඉතා සරල ආකාරයට භික්ෂූන් ජීවත්වීම සඳහා පරුමක, ගහපති, ගමික, බත ආදි ජන පිරිස් විසින් මේ ලෙන් පූජා කර ඇත(Paranavitana 1970). මේ පිළිබඳ ලිඛිත සාධක බෙහෙවින් වැදගත් වන අතර එය මෙහි සම්මත ඉතිහාස තීරණය කිරීමට ද පිටිවහලක් වී ඇත. වෙස්සගිරි භූ කලාපයේ සංස්කෘතික භූ දර්ශනයේ අවසාන සන්දර්භ ගත වීම මධ්‍ය ඉතිහාසය තුළට අයත් වේ. මේ සමය තුළ දී මෙම භූමි කලාපය තුළ වූ ලෙන් සඳහා ආවරණ ඉදි වන අතර ස්වභාවික පාෂාණ උද්ගතයන් ඉහළ ගොඩනැගිලි ඉදිකිරිම හා විහාරය පැවැති සීමාවට වඩා ප්‍රසාරණය වීම දැක ගත හැකි වේ. මේ දත්ත හඳුනා ගැනීමේ දි අභිලේඛන සාධක හා වාස්තු විද්‍යා නෂ්ටාවශේෂ

වැදගත්වන අතර 2006 වසරේ දී VG CAVE NO. 01 නැමති ස්ථාන නාමය යටතේ සිදු කරන ලද ගුහා කැණීමේ දී කටාරම් ගැටි සහිත ගුහා සඳහා ලෙන් ආවරණ ඉදිකිරීම සම්බන්ධ තොරතුරු ලැබී තිබේ. එමෙන්ම ශිලාලේඛන සාධක අනුව සීගිරි කසුබ් රාජ යුගයේ දී මෙම විහාරය බෝ *උපුල්වන් කසුබගිරි පබ්බත විහාරය* වශයෙන් හඳුන්වා දෙමින් පබ්බත විහාරයක් දක්වා සංස්කෘතික භූ දර්ශනය පරිණාමය වී තිබුණ බව පැහැදිලි වන අතර මෙම පුරා විද්‍යා හා අභිලේඛන සාධක මෙන් ම වාස්තු විද්‍යා නෂ්ටාවශේෂ මඟින් වෙස්සගිරියේ ඉතිහාසය සම්මත සීමාවෙන් ඉතා ඈතට ගමන් කරන ආකාරය පිළිබඳ තොරතුරු වර්තමාන පර්යේෂණ මඟින් අනාවරණය වූ දත්ත ඔස්සේ පෙළ ගැස්විය හැක.

## ආශ්‍රය ග්‍රන්ථ හා ලිපි නාමාවලිය


Bell, H.C.P.

1906-07 - *Archaeology Survey of Ceylon* Department of Archaeology, Sri Lanka.

Coorey, P. G.

1984 - *An Introduction to the Geology of Sri Lanka (Ceylon)* - (Second Revised Edition) National Museum of Sri Lanka Publication.

Deraniyagala, S.

1972 – The Citadel of Anuradhapura 1969: Excavation in the Gedige Area *Ancient Ceylon No.2* Department of Archaeology (48-169).

1992 - *The Prehistory of Sri Lanka: an ecological perspective Part I & II* Department of Archaeology Survey, Memoir Volume 8.

*Epgraphia Zeylanica*

1934 - Edit by Codrington & S. Paranavitana Government of Ceylon

Paranavitana, S.

1972 – *Inscriptions of Ceylon Vol. I* Department of Archaeological Survey.

ගුණවර්ධන, ආර්.

1993 - *සිවුර සහ නඟුල* සමාජ විද්‍යාඥයන්ගේ සංගමය

පරණවිතාන, එස්.

1969 - පුරාතන දඹුල්ල *රුවන්දෙර* දෙවැනි කලාපය පරි. චන්ද්‍රානන්ද හිමි, ජී. සංස්කරණය. හේමසිරි හිමි, පී. ඌරාපොළ සිරි රතනජෝති පාරිවෙණික මහා ශිෂ්‍ය සංගමය. (01-05)

*මහා වංසය*

1996 - තෙවන මුද්‍රණය හික්කඩුවේ ශ්‍රී සුමංගල හා බටුවන්තුඩාවේ දේවරක්ඛිත කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ.

මෙන්ඩිස්, ඩී. ටී.

2006 - ලොවම මවිත කළ අසිරිමත් වෙස්සගිරිය *දිවයින බදාදා අතිරේකය* 2006 ඔක්තොම්බර් 25

*සද්ධර්මාලංකාරය* (සංස්කරණය. මකුළුදුවේ පියරතන)

1935 - කොළඹ

සෙනවිරත්න, එස්.

1996 - *පර්යන්ත ප්‍රදේශ හා ආර්ථික ප්‍රජාවෝ මුල් අය සමයේ සමාජ සැදුම පිළිබඳ විකල්ප තේරුමක් කරා* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

ඡායාරූප

